## සංක්ෂිප්තය

රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍යම සාධකයක් වන්නේ අධ්‍යාපනයයි. එබැවින් අධ්‍යාපනය මුලික මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇති අතර ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යය කර ඇත. එසේම සම අධ්‍යාපන අවස්ථා සැපයීම සඳහා නිරන්තර සැලසුම් සහ ක්‍රම වේදයන් සකසා ක්‍රියාත්මක කරණු දැකගත හැකිය. එහෙත් දිනෙන් දින ලෝකයේ අධ්‍යාපනය සම්බන්ද ගැටලු වර්ධනය වෙමින් පවති. ශ්‍රී ලංකාවේද අධ්‍යාපනය සම්බන්ද ගැටලු රාශියක් දශක ගණනාවක සිට පවති. අධ්‍යාපන සැලසුම්කරණය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන ප්‍රතිපත්තිවල, විෂයමාලාව, අධ්‍යාපනයේ සම්පත් බෙදීයාම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, ශිෂ්‍ය සාධන මට්ටම, ඇගයීම් ක්‍රියාවලිය, ශිෂ්‍ය සහභාගිත්වය, නිසි වයසේදි පාසලට ඇතුළත් නොවන දරුවන් සිටීම, ප්‍රාථමික අධ්‍යාපනය හෝ අවසන් නොකර අතරමග අධ්‍යාපනය අත්හැරීම, පාසල් විනය ආදි වු ක්ෂේත්‍ර ගණනාවක් පුරාවට විවිධ ස්වරූපයන්ගෙන් ගැටලු පවති, අධ්‍යාපනය මුලික මිනිස් අයිතිවාසිකමක් ලෙසත්, ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යය බවත්, සැමට සම අධාපන අවස්ථා ලබාදිය යුතුය යන අදහස් පැවතියද එක් දිනකට හෝ පාසලකට නොගිය දරුවන් දහස් ගණනක් වත්මන් ලෝකය තුල ජීවත් වේ. එයින් පැහැදිලි වන්නේ කුමන ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළද නොවිසදනු අධ්‍යාපන ගැටලු රාශියක් පවතින බවය.

මෙම අධ්‍යාපනය ආශ්‍රිත ගැටලු විසදා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීමට විවිධ පර්යේෂණ, සමීක්ෂණ ආදිය සිදුකරණු ලැබේ. ඒ ඇසුරින් පවත්නා ගැටලුවලට හේතු සොයා බැලීමද, අවශ්‍ය ප්‍රතිත්ති සහ ක්‍රමවේදයන් සැකසීමද සිදුකරණු ලබයි. එහෙත් දිනෙන් දින ගැටලු වැඩිවීමක ප්‍රවණතාවයක් පවති. අධ්‍යාපනයේ පවත්නා ගැටලු සඳහා හේතු විමසීමේදි සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය පුරාවට ඉහළ සිට පහළට ගලා එන සම්ප්‍රදායික නිලබල ක්‍රමයක් ක්‍රියාත්මක වීම නිසා ඇතිවන තත්ත්වයන් හේතුවක් වී ඇතිබව අනාවරණය වී ඇත. විශේෂයෙන් සාර්ව සැලසුම් කරණය තුළ අධ්‍යාපනය සහ ක්‍රියාවලිය සමාජ අවශ්‍යතා සමග නොගැලපීමක් ඇතිවීමෙන් අධ්‍යාපනයේ ගැටලු වර්ධනය වී ඇත. මෙම තත්ත්වයන් හමුවේ පාසල ප්‍රජා කේන්ද්‍රීය ආයතනයක් බව පිළිගනිමින් අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා ප්‍රජාව සහභාගිකරවා ගැනීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය. එහෙත් අපේක්ෂිත ප්‍රජා දායකත්වය ලබාගැනීමට නොහැකිවී ඇත.

ගුරුදෙගුරු සමිතිය, පාසල් සංවර්ධන සමිතිය, පාසල් සංවර්ධන මණ්ඩල, පාසල් නගාසිටුවීමේ වැඩසටහන ආදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂාකරණු ලැබුවේ පාසල් සංවර්ධන කාර්යය සඳහා ප්‍රජාව පුළුල් ලෙස දායක කරගැනීමටය. එහෙත් වර්තමානය වනවිට බොහෝ පාසල් තුළ අපේක්ෂිත ප්‍රජා දායකත්වය ලබාගැනීමට නොහැකිව කටයුතු කරණු දැකගත හැකිය. මෙම තත්ත්වය ඵලදායි පාසලක් ගොඩනගා ගැනීමට ප්‍රබල බාධාවක් වී ඇත. එලෙස පාසල සමග ප්‍රජා සබඳතා වර්ධනය කිරීම සඳහා විවිධ කටයුතු සිදුකලද ප්‍රජාව පාසලෙන් දුරස්වීම අධ්‍යයන ගැටලුව සඳහා පසුබිම් විය.

එම අධ්‍යයන ගැටලුව හඳුනා ගැනීමෙන් පසු පර්යේෂණ අරමුණු තීරණය කිරීමට හැකිවිය. ඒ අනුව මුලිකව පාසල් ඵලදායිතාව සඳහා ප්‍රජාවගේ දායකත්වයේ පවත්නා වත්මන් තත්ත්වය හඳුනාගැනීම, පාසල් ඵලදායිතාව සඳහා බාහිර පාර්ශවකරුවන්ගේ දායකත්වය පිළිබඳ දෙමව්පියන්ගේ ආකල්ප විමසීම, පාසල්වල කුමන අංශයන්ගේ ඵලදායිතාව වර්ධනය සඳහා ප්‍රජා දායකත්වය අවශ්‍යද, පාසල් කටයුතු සඳහා ප්‍රජාවගේ දායකත්වය පහළ වැටීමට හේතු සොයා බැලීම, ප්‍රජා දායකත්වය ලබාගැනීම සඳහා පාසල් කළමනාකාරීත්වය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න සොයා බැලීම ආදි අරමුණු පදනම්කරගනිමින් මෙම පර්යේෂණ ක්‍රියාවලිය සිදුකර ඇත.

මෙම පර්යේෂණ ක්‍රියාවලියේදි ගැටලුව සහ ඒ ආශ්‍රිත සංකල්පයන් සම්බන්ධයෙන් සිදුකර ඇති විවිධ පර්යේෂණ තොරතුරු අධ්‍යයනය කිරීම සිදුකළ අතර ඒ සම්බන්ධ තොරතුරු දෙවන පරිච්ඡේදයේ දක්වා ඇත. ඵලදායිතා සංකල්පයත්, පාසල් ඵලදායිතාව පිළිබඳවත්, පාසල් ඵලදායිතාව සඳහා ප්‍රජාව දායක කරගැනීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳවත් දේශිය සහ විදේශිය වශයෙන් පර්යේෂණ තොරතුරු එහි දක්වා ඇත.

පර්යේෂණ ගැටලුව පිළිබඳ ඉතා පුළුල් අධ්‍යයනයක් සිදුකළ හැකිය. එහෙත් පාඨමාලා කාලය අනුව පුළුල් පරාසයකට යාම සාර්ථක නිබන්ධයකට බාධාවක් බැවින් පර්යේෂණ මාතෘකාවත් නියදියත් සීමාකර ගැනීම සිදුකර ඇත. ඒ අනුව සියලුම පාසල් වෙනුවට 1C සහ 2 වර්ගයට අයත් පාසල් පහක්ද එම පාසල්වලට අයත් දරුවන්ගෙ

දෙමව්පියන්ගෙන් සියයක් අහඹු නියැදිකරණයෙන්ද, එම පාසල් පහේ විදුහල්පතිවරුන්ද, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ එක් පාසලකින් ගුරුවරුන් තිදෙනා බැගින් පහළොස් දෙනකුද  අධ්‍යයන නියැදිය ලෙස තෝරා ගැනීම සිදුකර ඇත.  අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබාගැනීම සඳහා දෙමව්පියන් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන්ද, විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සමග සම්මුඛ සාකච්ඡා මඟින්ද, නිරීක්ෂණ සහ ලේඛණ පරීක්ෂාවෙන්ද සිදුකෙරුණි.

දත්ත විශ්ලේශනය සඳහා සංඛ්‍යාත්මක වගු භාවිතා කරමින් විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිතාකර ඇත. එම දත්ත විශ්ලේෂණය ඇසුරින් පර්යේෂණ අරමුණුවලට අදාළ නිගමන රාශියකට යොමුවීමට හැකිවිය. පාසල් ඵලදායිතාවයේදි ප්‍රමාණවත් දායකත්වයක් බාහිර පාර්ශවකරුවන්ගෙන් නොලැබෙන බවත්, ඒ සඳහා දෙමව්පියන්ගේ දුර්වල ආර්ථික, අධ්‍යාපනික සහ සමාජීය පසුබිම ප්‍රධාන සාධකයක් වී ඇති බවත් ඊට අමතරව විදුහල්පති කළමනාකරණ දුර්වලතා, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම්වල දුර්වලතාද හේතු සාදක වී ඇතිබව නිගමනය කළහැකි විය. පාසල්වල ඵලදායිතාව වර්ධනයේදි භෞතික සම්පත් සංවර්ධනය සඳහා මෙන්ම දරුවන්ගේ ඉගෙනුම් අවස්ථා ඉහළ නැංවීමට වඩාත් ඉහළ දායකත්වයක් බාහිර පාර්ශවකරුවන්ගෙන් අවශ්‍ය බව නිගමනය කළහැකි විය.

පාසල් ඵලදායිතාව සඳහා බාහිර පාර්ශවකරුවන්ගේ දායකත්වය ඉහළ නංවා ගැනීම සඳහා පාසල් මට්ටමින්, අධ්‍යාපන කලාප මට්ටමින් සහ ජාතික මට්ටමින් කළයුතු කාර්යයන් පස්වන පරිච්ඡේදයෙන් යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත. පාසල ප්‍රජා කේන්ද්‍රීය ආයතනයක් බැවින් පාසලට ප්‍රජාවගේ ඇති අවශ්‍යතාව පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම, ඔවුන්ට පාසල තුළ පිළිගැනීමක් ඇතිකිරීමත්, පාසල් කටයුතු සඳහා ප්‍රජාව දායක කරගැනීම සහ ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැකසීමේ අවශ්‍යතාවත් යෝජනා කරඇත. විශේෂයෙන් පාසලට ප්‍රජාවගෙන් පමණක් අපේක්ෂා නොකර පාසලෙන් ප්‍රජාවට සිදුකල හැකි සේවාවන්ද යෝජනා කර ඇත. එසේම අධ්‍යයනය සඳහා යොමුවූ ක්ෂේත්‍රය ඉතා පුළුල් බැවින් තවදුරටත් පර්යේෂණ කාර්යය සඳහා යොමුවිය යුතු පැතිකඩයන් කිහිපයක්ද සඳහන් වේ.